# මනස හා සංකල්ප

වෙනස්වීම යන සංකල්පය භාරතීය වෛදික දර්ශනවල අර්ථදක්වනු ලැබුයේ යම් දෙයක් පරමාර්ථ වශයෙන් පවත්වාගෙන යන අතර එයට සම්බන්ධ යම් යම් ගුණවල වෙනස්වීමක් ලෙස ය. ජීවාත්මය හෝ ධර්මාත්මය හෝ වෙනස් නොවන්නක් විය. එහෙත් ඒ වටා බැඳුණු සිරුර වැනි දෑ දිරායෑමට ලක්විණි. භාරතීය වෛදිකයන්ට වෙනස්වීම පිටුපස එවැනි වෙනස් නොවන ජීවාත්මයක් හෝ ධර්මාත්මයක් හෝ අවශ්‍ය විය. එහෙත් බෞද්ධයනට මේ වෙනස්වීමට දෙනලද අර්ථකථනය ප්‍රශ්නයක් වුයේ ඉන් පරමාර්ථයක් වු ආත්මයක පැවැත්මක් ගැන කියැවුණු බැවින් ය.

පරමාර්ථයක් වු ආත්මයක් හා බැඳුණු මේ වෙනස්වීම පිළිබඳ අර්ථකථනය වෙනසකට භාජනය වුයේ අනුරාධපුර සමයේ ලංකාවේ මහාවිහාරයේ වැඩවිසූ භික්ෂුන්වහන්සේ අතින් යැයි මහාචාර්ය වයි. කරුණාදාස මහතා පවසා ඇත. මහාවිහාරික භික්ෂුන්වහන්සේ වෙනස්වීම යන්න අර්ථදැක්වුයේ එකක වෙනස්වීමක් ලෙස නොව ඇතිවෙමින් නැතිවෙන ප්‍රවාහයක් (පද්ධතියක්) ලෙස ය. මෙහි දී උදාහරණයක් ලෙස විදුලි බුබුළු වැලක් ගත හැකි ය. ඒ වැලෙහි සෑම විදුලි බුබුළක් ම යම් කාලාවරතයක දී දැල්වී නිවී යන්නේ යැයි සිතමු. ඒ ඒ විදුලි බුබුළු වැලෙහි ඒ ඒ තැන්වල පිහිටා ඇත. මේ විදුලි බල්බ දැල්වී නිවී යෑම ඈතින් සිට බලන අයකුට පෙනෙන්නේ විදුලි ධාරාවක් වැලෙහි එක් කොණක සිට අනෙක් කොණට ගමන්කරන බව ය. විදුලි ධාරාව ගමන්කිරීම යනු පිහිටීම වෙනස්වීමකි. මෙහි වෙනස්වීම යන්න යමක වෙනස්වීමක් නො වෙයි. ඒ ඒ තැන පිහිටි විදුලි බල්බ දැල්වී නිවෙයි. එය වෙනස්වීමක් ලෙස නිරීක්ෂකයා විසින් ගනු ලැබෙයි.

මේ සාදෘශ්‍ය එතරම් යෝග්‍ය නොවන නමුත් අපට කීමට අවශ්‍ය දේ ඉන් පැහැදිලි වෙයි. විදුලි බල්බය පවතින්නේ ද ආදී ප්‍රශ්න රාශියක් යමකුට ඇසිය හැකි නමුත් එවැන්නකු සාදෘශ්‍ය යන්නෙන් අදහස්කරන්නේ කුමක්දැයි නොදන්නා බව පැහැදිලි ය. අපට අවශ්‍ය වන්නේ වෙනස්වීමක් මිස වෙනස්වන්නක් නැති බව පැහැදිලිකිරීම පමණකි. අනුරාධපුර යුගයෙහි ලංකාවෙහි වැඩවිසූ ථෙරවාදී භික්ෂුන්වහන්සේට වෙනස්වීම පිළිබඳ නව දැනුමක් නිර්මානයකිරීමේ හැකියාව තිබූ බව අප අමතක නොකළ යුතු ය. මෙහි දී අවධාරණය කළයුතු තවත් කරුණක් වෙයි. වෙනස්වන්නක් නැත, වෙනස්වීමක් ඇත යන්න වුව ද පරමාර්ථ ලෙස නොගත යුතු ය. වෙනස්වීම වුව ද අප විසින් නිර්මාණය කරගන්නා ලද දැනුමක් වෙයි.

අප විසින් මනස හා චිත්ත පිළිබඳ දැනුම නිර්මාණය කරනු ලැබුයේ පෙර වැඩ විසූ මහාවිහාරික භික්ෂුන්වහන්සේ ගේ වෙනස්වීම පිළිබඳ අර්ථකථනය යොදාගනිමින් ය. අප ප්‍රවාද නිර්මාණයකිරීමේ දී අපේ සංස්කෘතියෙහි ඇති දැනුම යොදාගන්නේ කෙසේ ද යන්න එමගින් පැහැදිලි වන්නේ යැයි සිතමි. ඒ අතර අප විසින් නිර්මානාත්මක සාපේක්ෂතාවාදය ද යොදාගනු ලැබෙයි. වෙනස්වන්න පමණක් නොව වෙනස්වන්න ද අපේ නිර්මානයක් ලෙස අපි සලකමු. එසේ නම් අප විසින් නිර්මානය නොකෙරෙන යමක් ලෝකයේ නැත්ද යන ප්‍රශ්නය වෙයි.

ඒ ප්‍රශ්නයට පිළිතුර නැත යන්න ය. ලෝකය යනු අප විසින් නිර්මානයකෙරෙන දැනුම මිස අනෙකක් නො වෙයි. අප දැනුම නිර්මානයකරන්නේ කුමකින් ද? එයට දියහැකි පිළිතුර ශුන්‍යයෙන් යන්න ය. ඉන් අදහස්වන්නේ අප දැනුම නිර්මානයකිරීමට පෙර ලෝකයක් නොමැති බව ය. වෙනත් වචනවලින් කියන්නේ නම් අප දැනුම නිර්මානයකිරීමට පෙර සංකල්ප වශයෙන් කිසිවක් නැත. සියළු සංකල්ප අපේ නිර්මාන වන විට සංකල්ප නිර්මානයකීමට පෙර සංකල්ප වශයෙන් කිසිවක් නැතැයි කීම වරදක් නො වෙයි. සංකල්පීය නොවන කිසිවක් පැවතිය හැකි ද යනුවෙන් දැන් වෙනත් ප්‍රශ්නයක් ඇසිය හැකි ය.

ඒ ප්‍රශ්නයට පිළිතුර සංකල්පීය නොවන දෙයක් තිබෙ ද නැත් ද යන්න හොඳ ප්‍රශ්නයක් නොවන බව ය. සංකල්පීය නොවන දෙයක් තිබෙන බව දැනගන්නේ කෙසේ ද? ඒ දැනගත හැක්කේ සංකල්පීය ව ය. එලෙස සංකල්පීය ව දැනගත හැකි සංකල්පීය නොවන යමක් ඇති බව අපට කිවහැකි නො වෙයි. අවශ්‍ය ම නම් අපට කිවහැක්කේ අප අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධය හේතුවෙන් සංකල්ප හා වෙනත් දැනුම් නිර්මානයකරන බව ය. මෙහි දී පැහැදිලි

© Prof. Nalin De Silva

කරගත යුතු කරුණ නම් අනිත්‍ය දුකඛ අනාත්ම යනු සංකල්ප නොවන බව ය. අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධකරගැනීමෙහි ලා ඇති ප්‍රධාන බාධකය ද ඒ සංකල්ප නො වීම ය. අප මනසින් අවබෝධකරගන්නේ සංකල්පීය වූ දැනුමකි. මනසට කළ හැක්කේ ද එලෙස සංකල්පීය දැනුම නිර්මානයකිරීම පමණකි.

සංකල්පීය නොවන දැනුමක් මනසින් අවබෝධකරගැනීමට නො හැකි ය. සංකල්පීය නොවන යන්නෙන් වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි යන්න ගම්‍ය නොවන බව අමතක නොකළ යුතු ය. වචනයෙන් ප්‍රකාශ නොකරන නමුත් චිත්ත රූප ලෙස සිතෙන් මවාගත හැකි සංකල්ප රාශියක් ඇති බවත් වචන ඉගෙනීමට පෙර කුඩා ළමුන්ගේ සංකල්ප සියල්ල එවැනි චිත්ත රූප බවත් තේරුම්ගත යුතු ව ඇත. මනසට සංකල්පවලින් තොරව ලබාගත හැකි කිසිවක් නැත. මනසින් ගන්නා සෑම දෙයක් ම සංකල්පීය වෙයි.

අපට නිවන් අවබෝධය මෙතරම් ම ගැටළුවක් වී ඇත්තේ මේ කරුණ හේතුකොටගෙන ය. නිවන සංකල්පයක් නො වෙයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම ද සංකල්ප නො වෙයි. එබැවින් නිවන් අවබෝධය මනසින් කළ හැක්කක් නො වෙයි. මනසින් තොරව අවබෝධයක් ලැබීමට නම් මනස යනුවෙන් දෙයක් නැති බව තේරුම්ගත යුතු ය. ඒ තේරුම්ගත හැක්කේ කෙසේ ද? පැහැදිලිව ම එය මනසින් නොකෙරෙන්නක් විය යුතු ය. නිවන් අවබෝධය සිදුවන්නේ නැති මනස නැති මනසක් බව නැති මනසින් අවබෝධ කරගත් විට යැයි සිතමි.

එය කීම පහසු වුවත් කිරීම අපහසු ය. බුදුන් වහන්සේ තණ්හාව නැතිකිරීමට උපදෙස් දී ඇත්තේ එය වඩා පහසු නිසා යැයි සිතිය හැකි ය. ඉන් අදහස්වන්නේ තණ්හාව නැතිකිරීම පහසු දෙයක් යන්න නො වෙයි. අපට නොයෙකුත් ආකාරයේ තණ්හා ඇත. ඒ සියල්ල නැතිකිරීම ඉතා අමාරු ය. එහෙත් එය නොකළ හැක්කක් නො වෙයි. තණ්හාව නැතිකිරීමේ දී තමන් කෙරෙහි ඇති ඇල්ම, බැඳීම, එනම් ඇලී සිටීම ආදිය නැතිවෙයි. තමන් නොදැනුවත් ම එවිට තමන් ද නැති බව පැහැදිලි වීමට පටන්ගනියි. ඒ නොදැනුවත් ම දැනගන්නේ ය යන්න වැදගත් වෙයි. නොදැනුවත්ම දැනගැනීම මනසට කළ හැක්කක් නො වෙයි.

මමත්වය, මමායනය, කෙමෙන් අඩුවේ නම් නැති මනස ගැන ද අවබෝධයක් නොදැනුවත් ම ඇතිවන්නේ යැයි සිතිය හැකි ය. තමන් යනුවෙන් කිසිවකු නැති බව තේරුම් ගත්විට කිසිවක ඇලීමක් තිබිය හැකි නො වෙයි. එහි විලෝමය ද අපට ප්‍රකාශ කළ හැකි ය. කිසිවක ඇලීමක් නැතිවිට තමන් යනුවෙන් කිසිවකු නැතැයි අවබෝධ වෙයි. එහෙත් ඒ අවබෝධය මනසින් ලබන්නක් විය නොහැක්කේ මනසක් ඇතැයි ගත්විට, තමන් යනුවෙන් කිසිවකු ඇතැයි ගම්‍යවන බැවින් ය. මම යන සංකල්පය හා මනස යන්න එකිනෙක සමග බැඳී ඇත. අනෙක් සියළු සංකල්පවලට මුල මනස හා මම ය. නැති මනසක් ඇතැයි යනුවෙන් ගැනීමෙන් අප පැටලී ඇත්තේ සංසාර චක්‍රයෙහි ය.

අප සංකල්ප හා දැනුම නිර්මානයකරන්නේ පළමුවෙන් ම මනස නිර්මානය කරගෙන ඇති බැවින් ය. සංකල්පවලින් තොරවූයේ ශූන්‍ය ය. ශූන්‍යය ද සංකල්පීය ව තේරුම් ගතහැක්කක් නො වෙයි. දෙවැනි සියවසෙහි පමණ වැඩ සිටි යැයි කියන, මහායාන බුදු සමයෙහි ආරම්භකයා ලෙස සැලකෙන නාගර්ජුන ස්වාමිපාදයන් වහන්සේ ශූන්‍යය ද ඇති සංකල්පයක් බවට පත්කළහ. උන්වහන්සේ එය ශූන්‍යතාව ලෙස හැඳින්වූහ. මේ උන්වහන්සේ අතින් සිදු වූ වරදක් ලෙස සැලකීම නිවැරදි වෙයි.

ඇතැමුන්ට අනුව නාගර්ජුනපාදයන් මහායානිකයකු ලෙස හැඳින්වීම වැරදි ය. ඔවුන් කියන්නේ උන්වහන්සේ දෙසූ කරුණු මූලික බුදුසමයට පටහැණි නොවන බව ය. එහෙත් ඒ පිළිගතහැක්කක් නො වෙයි. උන්වහන්සේ දෙසූ දහම හා ථෙරවාදය අතර මූලික වෙනස්කම් ඇති බව පැහැදිලි ය. ථෙරවාදයෙහි ශූන්‍ය ගැන කියැවෙයි. එහි ගැටළුවක් නැත. එහෙත් ථෙරවාදයෙහි ශූන්‍යතාවක් ගැන කියැවෙන්නේ යැයි නො සිතමි. ථෙරවාදයෙහි ශූන්‍ය ගැන කියැවෙන්නේ නැති යන අර්ථයෙන් ය. ශූන්‍ය යන්න වචනයක් වුව ද සංකල්පයක් නො වෙයි. ඒ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම මෙන් ය. එහෙත් ශූන්‍යතාව යන සංකල්පයෙන් නාගර්ජුනපාදයෝ ශූන්‍ය යන්න ඇති දෙයක් බවට පත්කරති. ගැටළුව ඇත්තේ එහි ය. අනාත්ම යන්න අනාත්මතාව ලෙස ගෙන ඇති දෙයක් බවට පත්කළහොත් එවැනි ම වූ වරදක් සිදුවෙයි. එහෙත් ආත්මයක් නැතැයි කීමට අපට ඉන් බාධාවක් නො වෙයි.

© Prof. Nalin De Silva

ශූන්‍යතාව ඇති දෙයක් ලෙස ගැනීමත් සමග නාගර්ජුනපාදයන්ට එය නිවනට වඩා “උසස්” තැනක තැබීමට සිදුවිය. ශූන්‍යතාව ද සංකල්පයක් බැවින් දැන් නිවන ද සංකල්පයක් බවට පත්විය. නාගර්ජුනපාදයෝ නිවන සංකල්පයක් ලෙස පමණක් නොව උන්වහන්සේගේ සාපේක්‍ෂතා ධර්මයට අනුව සසරට ප්‍රතිපක්‍ෂ වූ සංකල්පයක් ලෙස ද ගත්හ. උන්වහන්සේගේ සාපේක්‍ෂතා ධර්මය අයින්ස්ටයින් විද්වතාගේ සාපේක්‍ෂතාවාදයට කිසිසේත්ම සමාන නො වෙයි. මෙරට ඇතැම් පඬිවරුන් ඒ දෙක සංසන්දනයකිරීම විහිළුවකට වඩා දෙයක් නො වෙයි. අයින්ස්ටයින් පඬිවරයාගේ සාපේක්‍ෂතාවාදය විවිධ නිරීක්‍ෂකයන් ලෝකය මනින්නේ කෙසේ දැයි කීම සඳහාත් ඔවුන්ගේ විවිධ වූ මැනීම් අතර පවත්නා සම්බන්ධයන් හෙළිදරව් කිරීම සඳහාත් වූ ප්‍රවාදයකි. එහෙත් නාගර්ජුනපාදයන්ගේ සාපේක්‍ෂතාව එකම නිරීක්‍ෂකයකු සම්බන්ධයෙන් විය.

උන්වහන්සේගේ සාපේක්‍ෂතාව සැසඳිය හැක්කේ බටහිර වාග්විද්‍යාඥයකු වූ සොසූර්ගේ වචන පිළිබඳ වූ සාපේක්‍ෂතාව සමග ය. නාගර්ජුනපාදයන් කර ඇත්තේ යම් වචනයකට (සංකල්පයකට) අර්ථයක් ලැබෙන්නේ එහි විරුද්ධාර්ථය සමග සැසඳීමෙන් බව පෙන්වීම ය. සොසූර් පඬිවරයා කරන්නේ ද එයම ය. අඳුර යන්නට තේරුමක් ලැබෙන්නේ ඒ එළිය සමග සංසන්දනයකිරීමෙන් ය. එළිය යන්න නොමැතිව අඳුර යන්නට තේරුමක් නැත. මෙහි දී අඳුර හා එළිය සසඳන්නේ එකම නිරීක්‍ෂකයෙකි. එහෙත් අයින්ස්ටයිනීය ප්‍රවාදයෙහි පටන්ගැනීමෙහි දී ම නිරීක්‍ෂකයෝ දෙදෙනෙක් වෙති. නාගර්ජුනපාදයන්ට අනුව ඕනෑම අයකු ගත්කල නිවනට අර්ථයක් ලැබෙන්නේ සසරට සාපේක්‍ෂව ය. නිවන සසරෙහි විරුද්ධාර්ථය වෙයි. එහෙත් මෙහි දී ඉතා වැදගත් ප්‍රශ්නයක් ඇසීමට සිදුවෙයි. අඳුර එළිය සමග සංසන්දනයකිරීමේ වරදක් නැත. ඒ දෙකම සංකල්ප වෙයි. එහෙත් නිවන සසරට සාපේක්‍ෂව ගතහැකි ද? සසර යනු සංකල්පයකි. එහෙත් නිවන සංකල්පයක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva